**ශීර්ෂය 8 - ජාතික පොලිස් කොමිෂන් සභාව**

**-----------------------------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

**------------------**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

------------------------------------

ජාතික පොලිස් කොමිෂන් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වගන්තිය ප්‍රකාරව ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීට වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 30 දින නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ජාතික පොලිස් කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**----------------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී .ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

----------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38 (1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුලත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හදුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයනගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් අචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණ මා ප්‍රකාශ කරමි.

කොමිෂන් සභාව විසින් ඉකුත් වර්ෂයට අදාලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

1.6 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.6.1 **ගිණුම් ඉදිරිපත් කිරිම**

කොමිෂන් සභාව විසින් නියමිත දිනයට පහත සඳහන් සැසඳුම් ප්‍රකාශය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) වාර්ෂික මූල්‍ය ප්‍රකාශන<br>2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් පෙබරවාරි 28 දින හෝ ඊට පෙර විගණන පනතේ 16 (2) උප වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාවද ඉදිරිපත් කළ යුතු නමුත් එසේ ඉදිරිපත්කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව සෑම ආස්ථිතායක් විසින්ම මූල්‍ය ප්‍රකාශන සමඟ රීති මගින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාල සීමාවක් තුළ එම ආස්ථිථාවල වාර්ෂික කාර්යසාධන වාර්තාද ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. | වාර්තාවේ ඇතුලත් කරුණු පිළිබඳව විරෝධතාවයක් නැත. |

1.6.2 **ගිණුම්කරණ අඩුපාඩු**

(අ) ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතික වීම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන් දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන් දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායි තාවය පිළිබඳ කලින් කල සමාලෝචනය සිදු කර | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | වාර්තාවේ ඇතුලත් කරුණු පිළිබඳව විරෝධතාවයක් නැත. |

| | | |
|---|---|---|
| ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස් කම් සිදුකරනු ලැබිය යුතු බවත් එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයක් සිදු කල බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | | |
| (ii) රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම සම්බන්ධයෙන් ප්‍රමාණවත් ගිණුම් ක්‍රමයක් හා අභ්‍යන්තර පාලන ක්‍රමයක් පවත්වාගෙන යාම සඳහා ණය හා අත්තිකාරම් ලේඛන, ණය හා ණයගැති අත්තිකාරම් ලේඛනය, ණය හා ණයහිමි පරිදි ලියා ගොනු කල යුතු බව හා මාස්පතා දෙපාර්තමේන්තු පොත් භාණ්ඩාගාර පොත් සමඟ සැසඳූ බවට සහතික කර සැසඳුම් ප්‍රකාශයක විගණනකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු බව 2017.07.05 දිනැති 256/2017 රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛයේ සඳහන් කර තිබුණද එසේ සහතික කර ඉදිරිපත් කර නොතිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. | අත්තිකාරම් ගිණුම සම්බන්ධයෙන් වූ ණය හා අත්තිකාරම් ලේඛන ඉදිරිපත්කර ඇත. අත්තිකාරම් ගිණුමේ හර බැර දැක්වෙන මාසික භාණ්ඩාගාර මුද්‍රිත සමඟ සැසඳීම් කර මාස්පතා රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් වෙත යවා ඇති අතර ඉදිරියට එහි පිටපතක් විගණකාධිපති වෙත එවීමට කටයුතු කරමි. |

2. **මූල්‍ය සමාලෝචනය**

-----------------------

2.1 **වියදම් කළමනාකරණය**

--------------------------

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ---------------------- | ------------ | ------------------------------------- |
| මූලධන වියදම් | | |
| වැය විෂයයන් 03 ක් සඳහා සලසා තිබූ රු. 2,600,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් | ප්‍රතිපාදන උපරිම කාර්යක්ෂම තාවයකින් යුතුව උපයෝජනය කිරීඹට කටයුතු කල යුතුය. | විදේශ විනිමය අනුපාත නිතර වෙනස්වීම හේතුවෙන් භාණ්ඩ මිලදී ගැනීමට ඉදිරිපත් කරන ලද මිල |

| | | |
|---|---|---|
| රු.1,983,890 ක් ඉතිරිවී තිබුණි. එම ඉතිරිවීම් සියයට 54 සියයට 91 දක්වා පරාසයන් ගෙන තිබුණි. | | ගණන්වලට, භාණ්ඩ සැපයීමට සැපයුම්කරුවන් අපොහොසත්වීම හා ප්‍රාග්ධන ස්වරූපයේ වියදම් නොමැති වීම හේතු විය. |

3. **මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

3.1 **වාර්ෂික කාර්ය සාධන වාර්තා**

--------------------------------

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් මුදල් වර්ෂය අවසානයේ දින 150 ක් ඇතුලත සමාලෝචිත වර්ෂයට අදාලව කාර්ය සාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එසේ සිදු කර නොතිබුණි. | චක්‍ර ලේඛය ප්‍රකාරව නියමිත දිනට කාර්ය සාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය. | වාර්තාව සකස් කරමින් පවතින අතර මාසයක් තුල අවසන් කරමි. |

3.2 **අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම**

--------------------------------------------------

**(අ) මහජන පැමිණිලි විසඳීමේ ප්‍රගතිය පැමිණිල්ලේ ස්වභාවය අනුව**

-----------------------------------------------------------------------

2019 මාර්තු 08 දිනැති කොමිෂන් සභාවේ ලේකම්ගේ අංක NPC/Fin/01/02/2019 ලිපිය මගින් විගණනයට ලබා දී තිබූ තොරතුරු අනුව කොමිෂන් සභාව වෙත 2018 වර්ෂය තුලදී හා පෙර වර්ෂයේදී ලැබී තිබූ මහජන පැමිණිලි හා ඒවා විමර්ශනය කිරීමේ ප්‍රගතිය පැමිණිලි ස්වභාවය අනුව පහත පරිදි විය.

| | පැමිණිල්ලේ ස්වභාවය | 2017 ලද පැමිණිලි සංඛ්‍යාව | 2017 විසඳූ පැමිණිලි සංඛ්‍යාව | 2017 පැමිණිලි විසදීමේ ප්‍රතිශතය | 2018 ලද පැමිණිලි සංඛ්‍යාව | 2018 විසඳූ පැමිණිලි සංඛ්‍යාව | 2018 පැමිණිලි විසදීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|
| 1. | පොලිසිය විසින් ක්‍රියා නොකිරීම | 480 | 249 | 52 | 655 | 439 | 67 |
| 2. | පහරදීම | 33 | 13 | 39 | 30 | 20 | 67 |
| 3. | වදහිංසා පැමිණවීම් | 04 | - | - | 03 | 03 | 100 |
| 4. | බලය අයථා ලෙස පරිහරණය | 377 | 220 | 58 | 465 | 317 | 68 |
| 5. | කාන්තාවන්ට හා ළමුන්ට හිංසා කිරීම | 08 | 03 | 38 | 03 | 01 | 33 |
| 6. | නිති විරෝධී ලෙස රඳවා ගැනීම | 45 | 37 | 82 | 26 | 14 | 54 |
| 7. | අල්ලස් දූෂණ | 13 | 01 | 07 | 12 | 07 | 58 |
| 8. | පක්ෂග්‍රාහී වීම | 256 | 112 | 44 | 224 | 223 | 100 |
| 9. | බොරු චෝදනා කිරීම | 91 | 42 | 46 | 104 | 78 | 75 |
| 10 | පොලිස අත්අඩංගුවේදී මරණ සිදුවීම | 03 | - | - | 02 | 02 | 100 |
| 11 | මත්ද්‍රව්‍ය වැරදි | - | - | - | 29 | 16 | 55 |
| 12 | වෙනත් | 156 | 79 | 51 | 98 | 70 | 71 |
| **13** | **එකතුව** | **1,466** | **756** | **51** | **1,651** | **1,190** | **72** |

ඉහත තොරතුරු සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් සිදු කෙරේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) පසුගිය වසරට සාපේක්ෂව පැමිණිලි විසදීමේ ප්‍රතිශතය සියයට 51 සිට සියයට 72 දක්වා වැඩි වී තිබුණද ලැබී තිබූ මුළු මහජන පැමිණිලි සංඛ්‍යාව 1,466 සිට 1,651 දක්වා වැඩි වී තිබුණි. | පොලිස් නිලධාරීන් අතින් සිදුවන වැරදි අවම කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. | පැමිණිලි ලැබීම වර්ධනය වීමට හේතුව කොමිෂන් සභාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් අනුව මහජනතාව දැනුවත් වී තිබීම සැලකිය හැකිය. |
| (ආ) පොලිසිය විසින් ක්‍රියා නොකිරීම, බලය අයථා ලෙස පරිහරනය හා බොරු | පොලිස් නිලධාරීන්ගෙන් සිදුවන මෙම වැරදි අවම කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත | පැමිණිලි ඉහල අගයක් වාර්තා වීමට හේතුව යූ.එන්.ඩී.පී. ව්‍යාපෘතිය යටතේ ජනතාව |

| | | |
|---|---|---|
| චෝදනා කිරීම් සම්බන්ධ පැමිණිලි විසදීම් පසුගිය වසරට සාපේක්ෂව ඉහල ගොස් පැවතියද පැමිණිලි වාර්තා වීමද ඉහල ගොස් තිබුණි. | යුතුය. | දැනුවත් වීම දැක්විය හැකිය. |
| (ඇ) නීති විරෝධී ලෙස රදවාගැනීම සම්බන්ධ පැමිණිලි විසදීමේ ප්‍රතිශතය සියයට 82 සිට සියයට 54 දක්වා අඩු වී තිබුණි. | කොමිසම වෙත ලැබෙන මෙම පැමිණිලි විසදීම සඳහා කාර්යක්ෂම වැඩ පිළිවෙලක් යෙදිය යුතුය. | මෙම පැමිණිලි විසදීමේ ප්‍රතිශතය අඩුවීමට හේතුව පොලිස් නිලධාරීන් අධීක්ෂණය කොමිෂන් සභාව විසින් සිදුකරන බවට ඔවුන් දැනුවත් වී තිබීම හා අත් අඩංගුවට ගත් පුද්ගලයින් නීත්‍යානුකූල රාමුව මත අධිකරණයට ඉදිරිපත් කිරීමට කටයුතු කිරීමයි. |

**(ආ) මහජන පැමිණිලි විසදීමේ ප්‍රගතිය - පැමිණිලි ඉදිරිපත් වූ පළාත් අනුව**

2019 මාර්තු 08 දිනැති කොමිෂන් සභාවේ ලේකම්ගේ අංක NPC/Fin/01/02/2019 ලිපිය මගින් විගණනයට ලබා දී තිබූ තොරතුරු අනුව 2018 වර්ෂය තුලදී ලැබී තිබූ මහජන පැමිණිලි හා ඒවා විමර්ශනය කිරීමේ ප්‍රගතිය පළාත් අනුව පහත පරිදි විය.

| ප්‍රදේශය | 2018 වර්ෂය තුල ලද පැමිණිලි සංඛ්‍යාව | විමර්ශන අවසන් කළ සංඛ්‍යාව | විමර්ශන අවසන් කිරීමේ ප්‍රතිශතය |
|---|---:|---:|---:|
| ප්‍රධාන කාර්යාලය | 111 | 75 | 68 |
| <u>පළාත් කාර්යාල</u> | | | |
| බස්නාහිර | 494 | 339 | 68 |
| මධ්‍යම | 161 | 109 | 68 |
| වයඹ | 172 | 154 | 90 |
| දකුණ | 179 | 138 | 77 |
| උතුරුමැද | 86 | 70 | 81 |
| ඌව | 116 | 93 | 80 |
| සබරගමුව | 90 | 52 | 58 |
| උතුර | 65 | 56 | 86 |
| නැගෙනහිර | 177 | 104 | 58 |
| එකතුව | **1,651** | **1,190** | **72** |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය<br>----------------------- | | නිර්දේශය<br>------------ | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>--------------------------------------- |
|---|---|---|---|
| (අ) | වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් ලැබෙන බස්නාහිර පළාත් කාර්යාලයට ලද පැමිණිලි වලින් සියයට 32 ක් හෙවත් 155 ක් විසඳීමට ඉතිරිව තිබුණි. | වැඩි පැමිණිලි සංඛ්‍යාවක් ලැබෙන කාර්යාලවල පැමිණිලි විසඳීමට වැඩි අවධානයක් යොමුකළ යුතුය. | 2019 මැයි මාසය අවසන්වනන විට සියයට 94 ක් විසඳීමට කටයුතුකර ඇත. |
| (ආ) | සබරගමුව හා නැගෙනහිර පළාත් කාර්යාලවල පැමිණිලි විසඳීමේ ප්‍රතිශතය සියයට 58 තරම් අඩු මට්ටමක පැවතුනි. | පැමිණිලි විසඳීම් අප්‍රමාදව සිදුකිරීමට සුදුසු වැඩ පිළිවෙලක් අඛන්ඩක ක්‍රියාත්මක කල යුතුය. | 2019 මැයි 30 දින වන විට සබරගමුව කා ර්යාලයේ පැමිණිලි වලින් සියයට 86 ක්ද නැගෙනහිර කාර්යාලයේ පැමිණිලි වලින් සියයට 84 ක්ද විසඳා ඇත. නැගෙනහිර කාර්යාලයේ පැමිණිලි විසඳීම අවශ්‍ය පොලිස් වාර්තා කඩිනමින් ලබාදෙන ලෙස උපදෙස් ලබාදී ඇත. |

(ඇ) **බඳවා ගැනීමේ පටිපාටි අනුමත කිරීම**

---------------------------------------

| විගණන නිරීක්ෂණය<br>----------------------- | නිර්දේශය<br>------------ | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>--------------------------------------- |
|---|---|---|
| ශ්‍රී ලංකා පොලිසියේ නිළ ඇඳුම් කාර්යය මණ්ඩලයේ තනතුරු 06 න් පොලිස් කොස්තාපල් රියදුරු තනතුරද සහායක සේවයේ තනතුරු 104 න් 06 කටද අනුමැතිය ලබා දීමට ඉතිරිව තිබුණි | ඉතිරි තනතුරු සඳහා බැඳවාගැනීමේ පටිපාටි කඩිනමින් අනුමත කිරීමට අවශ්‍ය කටයුතු කල යුතුය. | මෙම තනතුරු 07 සඳහා අනුමැතිය ලබාදීමට ඇත. |

3.3 **වත්කම් කළමනාකරණය**

-------------------------------

| විගණන නිරීක්ෂණය<br>----------------------- | නිර්දේශය<br>------------ | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>--------------------------------------- |
|---|---|---|
| 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛය ප්‍රකාරව 2018 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු | චක්‍ර ලේඛය ප්‍රකාරව නියමිත දිනට භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කළ යුතුය. | ජුනි මස අවසන් වීමට පෙර සමීක්ෂණ කටයුතු අවසන් කරන ලෙස භාණ්ඩ සමීක්ෂණ කමිටුවට උපදෙස් ලබාදී |

| | | |
|---|---|---|
| කර එම වාර්තා 2019 මාර්තු 17 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, එසේ සිදුකර නොතිබුණි. | | ඇත. |

4. යහපාලනය
---------------

4.1 අභ්‍යන්තර විගණනය
------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කොමිෂම සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබූ බැවින් සමාලෝචිත වර්ෂය තුලදී අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | සම්පිණ්ඩන වාර්තාවේ කෙටුම්පතෙහි ඇතුලත් කරුණු පිළිබඳව විරෝධතාවයක් නැත. |

5. **මානව සම්පත් කළමනාකරණය**
**----------------------------------**

අනුයුක්ත කාර්ය මණ්ඩලය හා තථ්‍ය කාර්ය මණ්ඩලය සහ පුද්ගල පඩිනඩි සඳහා වියදම
----------------------------------------------------------------------------------------------------

කොමිෂන් සභාවේ කාර්ය භාරය ඉටු කිරීම සඳහා 2018 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳව විස්තර පහත දැක්වේ. කොමිෂන් සභාව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 70.39 ක් වැය කර තිබුණි.

| **සේවක වර්ගය** | | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 18 | 14 | 04 |
| (ii) | තෘතියික මට්ටම | 04 | 02 | 02 |
| (iii) | ද්විතික මට්ටම | 62 | 57 | 05 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 21 | 18 | 03 |
| (v) | වෙනත් | 14 | 13 | 01 |
| **එකතුව** | | **119** | **104** | **15** |

පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය අවසාන වනවිට තනතුරු 14ක් | පුරප්පාඩු සඳහා කාර්යමණ්ඩලය | පවතින පුරප්පාඩු සඳහා නිලධාරීන් ලබාදෙන ලෙස අදාල පත්වීම් |

| | | | |
|---|---|---|---|
| | පුරප්පාඩුව පැවතුන අතර එම පුරප්පාඩු පිරවීම සඳහා ක්‍රියාකර නොතිබුණි. | බඳවාගැනීමට ක්‍රියාකල යුතුය. | බලධාරීන්ගෙන් ඉල්ලා ඇත. |
| (ආ) | බස්නාහිර පළාත හැර සෙසු පළාත් 08 හි නිලධාරීන් 16 ක් පමණක් සේවය කරන අතර පළාත් අධ්‍යක්ෂවරු (කොන්ත්‍රාත්) 08 දෙනාට අමතරව විමර්ශන නිලධාරීන් 04 ක් සංවර්ධන නිලධාරීන් 02 ක් හා රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් 02 ක් සේවය කරනු ලැබේ. පළාත් කාර්යාල වෙත ලැබෙන පැමිණිලි විමර්ශනය සඳහා පළපුරුදු විමර්ශන කණ්ඩායම් එම කාර්යාලවල සේවයේ සිටිය යුතු නමුත් එසේ සිදුවී නොතිබුණි. | පළාත් කාර්යාල සඳහා විමර්ශන නිලධාරීන් අනුයුක්ත කල යුතුය. | විමර්ශන නිලධාරීන්ගේ හිඟකම නිසා සංවර්ධන නිලධාරීන් හා රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් පළාත් කාර්යාලවල සේවයේ යොදවා ඇත. |
| (ඇ) | බස්නාහිර/ප්‍රධාන කාර්යාලයේ විමර්ශන නිලධාරීන් 07 ක්, රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් 38 ක් හා කාර්යාල සේවක සේවයේ 12 ක් සමඟ එකතුව 88 ක් සේවය කරන නමුත් ප්‍රාදේශීයව සේවාවන් සැපයීමේදී කාර්යමණ්ඩලය බෙදීයාමේ වෙනසක් පවතින බව නිරීක්ෂණය වේ. | කොමිෂන් සභාවේ අංශ අතර නිලධාරීන් බෙදීයාමේ වෙනස්කම් අවම කිරීමට කටයුතු කල යුතුය. | බස්නාහිර / ප්‍රධාන කාර්යාලයේ මහජන පැමිණිලි විමර්ශනය සඳහා නිලධාරීන් 17 ක් යොදවා ඇති අතර සෙසු නිලධාරීන් මහජන පැමිණිලි විමර්ශනය හැර කොමිෂන් සභාවට පැවරී ඇති අනෙකුත් කාර්යයන් සඳහා යොදවා ඇත. |